# සිංහල භාෂාව හා සාහිත්‍යය තරග 2024(කලාප)

අපේක්ෂකයාගේ නම- ------------------------------------------------------------------------------------------
(මුලකුරු සමග නම)

පාසලේ නම හා ලිපිනය- ------------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------

පාසල් වර්ගය- 200 ට අඩු / 201-500 / 501 ට වැඩි

කොට්ඨාසය- ------------------------------------------------------------------------------------------

කලාපය- ------------------------------------------------------------------------------------------

11 ශ්‍රේණිය | ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන | කාලය පැය 03 (මුළු ලකුණු 100)

**I කොටසින් එකක්ද , II කොටසින් (අ) යටතේ එකක්ද ( ආ) යටතේ එකක්ද**
**( ඉ ) යටතේ එකක්ද වශයෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

**I කොටස**

පහත දැක්වෙන අ,ආ,ඉ,ඊ යන විස්තර අතුරින් එකක් තෝරාගෙන වචන 350 කට නොඅඩු රචනයක් ලියන්න.ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක්ද යොදන්න.

අ) වර්තමානයේ ලොව පුරා ත්‍රස්තවාදය ව්‍යාප්තව අවසන්ය.යුද ගැටුම් ඇති වීමට විවිධ හේතු බලපායි.යුධ ගැටුම් හේතුවෙන් මානව වර්ගයාට මෙන්ම පරිසරයටද බොහෝ බලපෑම් එල්ල වේ.මේ භයානක තත්ත්වය තුරන් කොට ලෝක සාමය ඇති කිරීමට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කාලය එළඹ ඇත.

ආ) නූතන සන්නිවේදන ජාලය මගින් මුළු ලොවම එකම ගම්මානයක් බවට පත් කර ඇත.භාෂණය , ලේඛනය හා සංඥා ආදිය සන්නිවේදනයේ මාධ්‍ය වේ.මෙමගින් නිවැරදි තොරතුරු කලට වෙලාවට දැන ගත හැකිය.ජන සන්නිවේදනයේ අරමුණ විය යුත්තේ සමාජයට යහපතක් සැලසීමය. මානව හිතවාදී සාධාරණ ලෝකයක් ගොඩ නැගීමට එහි හිතකර ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

ඉ) ශ්‍රී ලංකාව ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන රටකි.හෙළ සංස්කෘතික දායාද හා උරුම ඊට සාක්ෂි සපයයි.ඉපැරණි යුගවල දක්නට ලැබෙන නටබුන් අපේ පැරැන්නන්ගේ විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය ප්‍රදර්ශනය කරයි.මෙම හර පද්ධති තුළින් අතීත ජනයාගේ සදාචාරය පිළිබිඹු වේ.මේ වටිනා අතීත උරුමයන්ද සදාචාරයද ලංකාව බාහිර ලෝකයට නිරාවරණය වීමත් සමඟ විනාශ වෙමින් පවතී.

ඊ) වර්තමාන ලෝකයේ බොහෝ රටවල්වලින් ස්වභාවික විපත් හා ආපදා තත්ත්වයන් වාර්තා වේ.භූමිකම්පා, ගංවතුර , ලැව්ගිනි වැනි තත්ත්ව ඒ අතර ප්‍රධාන වේ. අහිතකර මිනිස් ක්‍රියාකාරකම් සඳහා සොබාදහම දෙනු ලබන දඬුවමක් ලෙසද මෙම ව්‍යසන සැලකිය හැකිය. මේ ආපදා කළමනාකරණය කිරීමට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවීමට කාලය එළඹ ඇත.

ලකුණු 40

**II කොටස**

ආ) **I.** ගනේවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය මගින් ප්‍රදේශයේ වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් වැඩමුළුවක් සංවිධානය කර ඇත.2024 ජූලි 23 වන දින පෙ.ව 9.30 සිට ප.ව 3.00 දක්වා වැඩමුළුව පැවැත්වේ. ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස විශාරද එඩ්වඩ් ජයකොඩි මහතා සහභාගී වීමට නියමිතය. වැඩමුළුව අතරතුර ජන ගී ගායනයක්ද සිදු වේ.වැඩමුළුව පැවැත්වෙන ස්ථානය ලෙස ගනේවත්ත ශ්‍රවණාගාරය තෝරා ගෙන ඇත.

උක්ත වැඩමුළුව පැවැත්වීමට ගනේවත්ත ශ්‍රවණාගාරය ලබාදෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය ලේකම් තුමා වෙත යවන රාජකාරී ලිපිය ලියන්න.ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් තිසර පෙරේරා ඔබ යැයි සිතන්න.

ලකුණු 20

**II.**කොටවිල මහා විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රීඩා උළෙල 2024 මැයි මස 28 වන දින පැවැත්වේ.මෙදිනට වේදිකා හා ආලෝක පහසුකම්ද ශබ්ද විකාශන යන්ත්‍රද අවශ්‍ය වී ඇත.නිදංගල ' සහන උත්සව භාණ්ඩ ' ආයතනයෙහි කළමනාකරු ලෙස මෙම අවශ්‍යතා සපුරා දෙන ලෙසත් මිල ගණන් දන්වා එවන ලෙසත් ඉල්ලා සිටිමින් යවන ලිපිය ලියන්න.

ආ.) I.ලේඛකයෙකුගේ ගුරු සමරු උත්සවයකට සහභාගී වූ පුවත්පත් වාර්තාකරුවෙකුගේ දළ සටහනක් පහත දැක්වේ.ඒ අතරින් පුවත්පතක් සඳහා වාර්තාවක් සකසන්න.( වචන 100ක් පමණ ප්‍රමාණවත් වේ.)

- කුමාරතුංග මුනිදාස , ගුණ සැමරුම
- දික්වැල්ල නගර ශාලාව
- 2024.04.30 පෙ.ව 9.00 - ප.ව 12.00
- මූලාසනය , පළාත් ප්‍රධාන අමාත්‍ය
- ප්‍රධාන දේශනය :- රත්නශ්‍රී විජේසිංහ මහතා
  සිංහල සාහිත්‍ය වෙනුවෙන් කළ අමිල මෙහෙය
- පාසල් ළමයි ඉදිරිපත් කරන "හත්පණ" නාට්‍ය
- සංවිධානය :- දික්වැල්ල - තරුණ සේවා සමාජය

ලකුණු 20

**II** .ඔබ විද්‍යාලයේ වර්ෂ අවසාන කළා උළෙල පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. මෙහිදී ඉදිරිපත් කරන වැඩසටහන් සෑම අංගයක්ම ඇතුළත් වන පරිදි මනා කාළ කළමනාකරණය යුක්ත න්‍යාය පත්‍රයක් සකසන්න.ඔබ මෙහි සංවිධායක යැයි සිතන්න.

ලකුණු 20

ඉ)

**I.**පුහුල්වැල්ල ප්‍රදේශයේ විවිධ පළතුරු වගා කටයුතුවල නිරත වෙන්නන් සඳහා ගොවි සමාජයක් ආරම්භ කිරීමට නියමිතය.සංගමයේ අරමුණු , පැවැත්වෙන ස්ථානය , දිනයක් වෙලාව මෙම වැඩසටහන පිළිබඳ විස්තරද ඇතුළත් කරමින් ගොවි පිරිස් වෙත දැන්වීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිළියෙළ කරන්න.

ලකුණු20

**II.** ඔබ ප්‍රදේශයේ සුනඛයන්ගේ හමේ රෝගයන් ශීඝ්‍රයෙන් පැතිර යයි.ඔබ පශු වෛද්‍ය නිළධාරිවරයා යැයි සිතන්න.මෙම රෝගය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට අත්පත්‍රිකාවක් සකසන්න.රෝගය වැළඳීමට හේතු වළක්වා ගැනීමට යෙදිය යුතු උපාය මාර්ග රෝගයෙන් සිදු වන හානිය , රෝගී සුනඛයෙකු බේරා ගැනීමට ගත යුතු පියවර යන කරුණු අත් පත්‍රිකාවේ අඩංගු විය යුතුය.

ලකුණු 20